## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1985 අංක 11 දරන පලාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 මාර්තු මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 මාර්තු මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත 45 යි　　　　තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1985 අංක 11 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 මාර්තු මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 58/82

**1979 අංක 3 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මෙම පනත 1985 අංක 11 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙයින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1979 අංක 3 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1979 අංක 3 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත අභියාචනයක් ලැබුණු විට, පළාත් පාලන ආයතනය විසින් කර ඇති නියමය, ඔහු විසින් ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ ඉවත් කිරීම කරනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) (අ) 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද ;

(ආ) 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද

අභියාචනයක් විභාග කිරීම සඳහා අමාත්‍යවරයාට ඇති බලතල, ඔහු විසින් ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතින් පිහිටුවන ලද පළාත් පාලන සේවා කොමිෂන් සභාව වෙත පවරා දෙනු ලැබිය හැකි ය :

එසේ වුවද, එවැනි පවරාදීමක් කරනු ලැබ තිබුණ ද එය නොතකා යම් පළාත් පාලන ආයතනයක් විසින් කරන ලද නියමයකට විරුද්ධව කරන ලද අභියාචනයක් විභාග කිරීමේ බලය, තමා විසින් ම ක්‍රියාවේ යෙදවීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි අතර, එම බලය පවරනු ලැබ ඇති පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් එවැනි අවස්ථාවක දී එම බලය ක්‍රියාවේ යෙදවීම කරනු නොලැබිය යුතු ය.";

2—ජ 032453—7,025 (85/02)

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "(1) වන උප වගන්තිය යටතේ රජයේ නිලධරයකු විසින් කරන ලද" යන වචන වෙනුවට "(1) වන උපවගන්තිය යටතේ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් කරන ලද" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"පළාත් පාලන සේවා කොමිෂන් සභාව වෙත බලතල පැවරීමට අමාත්‍යවරයා සතු බලය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය— සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, ඒ වගන්තියේ "සුළු නගර සභා ආඥාපනත සහ ගම් සභා ආඥාපනත" යන වචන වෙනුවට "සුළු නගර සභා ආඥාපනත, ගම් සභා ආඥාපනත සහ 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) මේ පනත යටතේ අභියාචනා කළ යුතු කාල සීමාව සහ ආකාරය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය, ඒ වගන්තියේ "පළාත් පාලන ආයතනය" යන අර්ථකථනයෙහි "නගර සභාව, සුළු නගර සභාව හෝ ගම් සභාව" යන වචන වෙනුවට "නගර සභාව හෝ සංවර්ධන සභාව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.